එකම බිම් කට්ටියේ ලෝක දෙකක් මෙන් පවතින ගමත් වත්තත් ඒකාබද්ධ කරන්නේ කොහොමද? මේ තත්වය මෙන්ම මෙහිදී මතුවන ප්‍රශ්නත් ආයතනය කළ පර්යේෂණයක විෂයය වුනා. ඒ අනුසාරයෙන් සක්ස් කරගත් ලිපියකි මේ.

# ගමයි වත්තයි එකට එක්වේ?

**ආයතන අධ්‍යයනයක් කියන දේ– 'දෙවන පංතියේ පොල් ඉඩම් සංවර්ධනය'**

**ගමේ ඉඳලා නාර පාරට හැතැප්මක් විතර ඇති. හදිස්සි ලෙඩෙක් ගෙනියන්නවත් වාහනයක් සුද්දගේ වත්ත හරහා ගෙනියන්න බැහැ. වත්තේ පාර අපිට වැහිලා. ලෙඩා කර තියන් නියරදිගේ පාරට ගේන්න ඕන. වාහන ගැන මොකට කියනවාද? අපේ කරත්තයක් වත්තේ පාරෙන් ගෙනියන්න බැහැ. පාරේ බෝක්කු වෙනුවට තියෙන්නේ යකඩ බම්බු ගොනාට යන්න බැහැනේ. කරත්තයක්වත් ගෙනියන එක නවත්තන්න සුද්ද අපිට කරදර කළා.**

විදේශීය සමාගම් වත්තක මායිමේ පිහිටි ගමක වැඩිහිටියෙක් ඔවුන්ගේ දුක්ගැනවිල්ලක් ගැන කිව්වේ ඔහොමයි. මේ තත්වය ලොකු වතු තිබුණ හැම පැත්තකම දකින්නට තිබුණා. ගමයි වත්තයි එකම පොලොවේ එකම බිම් කට්ටියේ තිබුණත් ඒ ඒ දෙක ලෝක දෙකක් වගෙයි. වතු ඉඩම් වල නියම උරුමය තිබුණ ගැමියන් හිටියේ අභිකුන්ටික මිනිස්සුන්ගේ තත්වයේ. ඔවුනට ගොවිතැන් කර ගන්න තිබුණ ඉඩම්වල බිහිවුන, වතු අයිතිකාරයො පුළුවන් තරම් ලාභගත්ත විතරයි. ගමටවත් ගැමියන්ටවත් ඔවුන් පිළිසරණක් වුනේ ඉතාම කලාතුරකින්.

ගොවිතැනින් යැපුන අපේ පරම්පරාගත ආර්ථික රටාව වෙනස් කලේ මේ වැවිලි වතු ක්‍රමයයි. ශ්‍රමය කුලියට ගෙන, වටපිටාවක් ගැන නොබලා උපරිම මට්ටමින් ධනය එකතු කරන් ගමින් පිට කරගත් වතු ක්‍රම යකුත්, රැකියා, ඉඩම්, ආදයම් හිගයෙන් පෙලුන දුක්පත් ගැමි ජීවන රටාවකුත් ඇතුළත් දෙබිඩි ආර්ථික ක්‍රමයක් අපිට ලැබුනේ මේ වැවිලි වතු ක්‍රමයෙන්.

මේ දෙබිඩි තත්වය නැති කිරිමට ගත්ත මූලික පියවර තමයි, ඉඩම් ප්‍රතිසංස්කරණය යටතේ විශාල සමාගම් වතුත්, රජයට පවරා ගැනිම. රැකියා ඉඩකඩ වැඩි වන අයුරින් නිෂ්පාදනය වැඩි කර ගැනිම හා ඉඩම් හිඟය නැති කර වතු හා ගැමි යනුවෙන් අප මත පැටවී ඇති දෙබිඩි ආර්ථික රටාව වෙනස් කර වතු හා ගැමි ආර්ථික ක්‍රමය ඒකාබද්ධ කිරිම ඉඩම් ප්‍රතිසංස්කරණයේ මූලික පරමාර්ථ ලෙස කෙටියෙන් දක්වන්න පුළුවන්.

## පොල් ත්‍රිකෝණය

**ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය මෙහිලා ප්‍රයෝජනවත් වන කරුණු ගැන සොයා බලා වාර්තාවක් සකස් කළා. ආයතනය මේ සඳහා තෝරා ගත්තේ කොළඹ දිස්ත්‍රික්කයේ පොල් වගා කරන මිනුවන්ගොඩ, මීරිගම, දිවුලපිටිය, හා නිට්ටඹුව වැනි ප්‍රදේශවල ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට පැවරුන පොල් ඉඩම්. මේ පැතිවල පලදාව අක්කරයකට පොල් 3,000–3,500 ත් අතර වෙනවා. මෙම ඉඩම් අපේ පොල් ත්‍රිකෝණය ලෙස හැඳින්වෙන කොළඹ, කුරුණෑගල හා පුත්තලම පළාත්වල දෙවන පංතියේ පොල් ඉඩම් ලෙස හඳුන්වනවා. කොළඹ දිස්ත්‍රික්ක**

යේ පොල් ඉඩම් අක්කර 1,17,000 න් 98, 370 ක්ම දෙවන පංතියේ ඒවා. පොල්වලට ඉතා හොඳ අක්කරයකට පොල් 5,000 ක් 6,000 ත් කැඩෙන ඉඩම් පළවෙන පංතියේ ඉඩම් ලෙස සැලකෙනවා.

කොළඹ දිස්ත්‍රික්කයේ දෙවන පංතියේ පොල් ඉඩම් සංවර්ධනය කියලා නම් කරලා ඇති මෙම ආයතන පර්යේෂණ යේ මූලික පරමාර්ථය වුනේ මේවායේ ඉඩම් පරිහරණය, පලදාව හා රැකියා ඉඩකඩ තත්වය ගැන සොයලා, පලදාව හා රැකියා ඉඩ වැඩි වෙන අයුරින් එම ඉඩම් අසල ගම්මාන හා ඒකාබද්ධ කළයුතු ආකාරය ගැන යෝජනා ඉදිරිපත් කිරීමයි.

## ඒකාබද්ධ කළ යුත්තේ ඇයි?

මෙතෙක් කුඩම්මාගේ සැළකිල්ල ලබමින් තිබූ ගැමි ආර්ථික රටාවට නව පනක් දී ස්වයංපෝෂිත තත්වයට නැංවීමට හා ඉඩම් ප්‍රතිසංස්කරණයේ පරමාර්ථ ඉෂ්ඨ කර ගැනිමට නම් ගමත් වත්තත් ඒකාබද්ධ කළයුතුම වෙනවා. මේ හැර මීට තුඩු දුන් තවත් විශේෂ හේතුන් කිහිපයක් වාර්තාවෙන් දක්වා තිබෙනවා.

ඉඩම්වලට ඇති ජනගහණ බලපෑම අඩු කිරීම ඉන් එකක්. වතු මායිම්වල ඇති ගම්වල ඉඩම් ප්‍රමාණය ගම්මුන්ට නොසෑහේ. ඉඩම් නැත්තවුන්ට හා ප්‍රමාණවත් ලෙස ඉඩම් නැති අයට ඉඩම් ලබා දීමට මෙන්ම රැකියා නොමැති හා ස්ථිර රැකියා නැති හා එදිනෙද යමක් කර දිවි ගෙවන අයට රැකියා දීම කළහැක්කේ වතු හා ගම්වල ඇති සම්පත් ඒකාබද්ධ කර පොදුවේ ප්‍රයෝජනයට ගැනිමෙනි.

පළාතේ ගොවිතැන් කටයුතු විවිධාංගකරණය කොට නිෂ්පාදන සැළසුම් කිරිම හා අලෙවි කිරිම විධිමත් කිරීමේ ආර්ථික පදනම ලෙස ඒකාබද්ධ වතු ගම් සංවිධානයකට කටයුතු කළහැක. කෘෂිකර්මය පදනම් කර ගත් කර්මාන්ත ඇරඹීමට මෙන්ම අලෙවි හා සැපයුම් කටයුතුද මේ අනුව මනාව සකස් කර ගතහැකි බවත් ඉන් පෙන්වා දී තියෙනවා.

මංමාවත්, ජල පහසුකම්, විදුලි බලය වැනි සේවා සැලසීමේදී මෙතෙක් පෞද්ගලික වතුවලට ලැබුණු විශේෂ සැලකුම් නැති කර ඒවා පොදුවේ ගමටත් වතුවලටත් ලැබෙන සේ වඩා විධිමත් කිරිම තවත් ප්‍රධාන හේතුවක්.

වඩා හොඳ ගොවිතැන් ක්‍රම හඳුන්වාදීමෙ, පුහුණු කිරීමේ හා ආදර්ශ පැවැත්වීමේ මධ්‍යස්ථානය මෙන්ම ගොවි නිපයුම් මධ්‍යස්ථානයක් ලෙසින් වතුවලට ඇති පහසුකම් ගම්මුන්ටද පොදුවේ ලබා දිය යුතු බවත් අධ්‍යයනය පැහැදිලි කරලා.

ග්‍රාම සංවර්ධන සමිති, සමුපකාර සමිති වැනි ග්‍රාමීය ආයතන විධිමත් කර ඒවායේ කාර්යයන් පුළුල් කිරිම තවත් හේතුවක්. මෙම සමිතිවල සේවා වතුවලටද ලැබෙන අයුරින් මෙන්ම වතුවල අයටද මෙම සමිතිවල කටයුතුවලට එක් වීමට ඉඩකඩ සැළැස්වීම.

ගැමියන් හා ගම් වලින් ඇත් වූ ඒකක ලෙස තවදුරටත් කටයුතු කිරීමට වතුවලට ඉඩ නොදිය යුතු බවත් අධ්‍යයනය පෙන්වා දී තියෙනවා. ස්ථිර නිෂ්පාදන පදනමක් මත දෙපැත්ත එකමුතු කළවිට ගැමියන් වතු නිසා නඩත්තු වන පුද්ගලයන් යන වැරදි හැඟීම් ඉවත් කළහැක. ගමත් වත්තත් අතර වන එදිරිවාදිකම් හා ඊර්ෂ්‍යාව තුරන් කළහැක්කේ මෙසේ කටයුතු කිරීමෙනි.

## ඒකාබද්ධ කිරීමේ මාර්ග

**වතු කාර්ය මණ්ඩල, ඉහළ තත්වයක් අය ලෙසින් සිතා කටයුතු කිරීමත්, තමනට එතරම් තත්ත්වයක් නැතැයි යන ගැමි සිතුවිල්ලත් ඉවත්වන අයුරින් කටයුතු කිරීම මෙහිලා වැදගත් බව පර්යේෂණය දක්වා ඇත. මෙම මාර්ග, ආර්ථික, ආයතනික හා සමාජයිය ලෙසින් වාර්තාවේ වෙන් වෙන්ව දක්වා ඇත.**

**ආර්ථික සහයෝගීතාවය** - ආර්ථික ඒකාබද්ධතාවයක් ඇති කිරීමේලා ගතහැකි ක්‍රියා මාර්ග කිහිපයකි. රැකියා විරහිත ගැමියන්ට වතුවල රැකියා ඉඩ ලබාදීම මෙහිලා මූලික වේ. වතු අසල පිහිටි ගම් වලින්ම වතුවල රැකියා සඳහා පුද්ගලයන් තෝරා ගැනීම මෙහිදී සිදුවිය යුතුය.

වතුවල ඇති ට්‍රැක්ටර්, වතුර පොම්ප, ලොරි වැනි සේවා හැකි සෑමවිටම ගැමියන්ටද මුදල් ගෙවා ලබාගත හැකි වන පරිදි කටයුතු කිරීම. ගොවි මෙවලම් හා නිෂ්පාදන දෙපැත්තේම පහසුකම හා ශිල්පීය දැනීම ප්‍රයෝජනයට ගෙන නිපදවීම. වතුවලට පහසුවෙන් ලැබෙන පැල, සතුන් වැනි දේ ගැමියන්ටද ලබා දීම.

ශ්‍රම සේවාවන් වතුවලට මෙන්ම ගැමියන්ටද එකසේ ලැබෙන අයුරින් සකස් කිරීම. සමුපකාර සමිතිවල ගිණුම් කටයුතු මනාව පවත්වා ගැනීමට වතුවල සිටින ගිණුම් නිලධාරීන්ට උපකාරී විය හැක. එලෙසින්ම වතුවල කාර්මික නිලධාරීන්ට ගමේ ඇති උපකරණ නඩත්තු කිරීමේලා සහාය විය හැකිය. ගමට මෙන්ම වත්තටද කම්කරු සේවා උපරිම වශයෙන් අවශ්‍ය අවස්ථාවන් හිදී දෙපාර්ශවය සහයෝගිතාවයෙන් කටයුතු කිරීම.

ගොවි ව්‍යාප්ති කටයුතු, ආදර්ශන හා පුහුණුකිරීම් ක්‍රියාත්මක කිරීමේදී වත්තත් ගැමියනුත් එක මට්ටමේලා කටයුතු කිරීම. වතුවල කාර්ය මණ්ඩල පුහුණු කිරීමේදී ගමෙහි කුඩා ඉඩම් හිමියන්ද ඊට සහභාගී කරවා ගැනීම නිදසුනක් ලෙස දක්වා ඇත.

යෙදවුම් හා අලෙවි පහසුකම් සැලසීමේදී වත්තත් ගමත් එකම ඒකකයක් ලෙස කටයුතු කළහොත් සංවිධානාත්මක වශයෙන් ගැමියනට ඇති අඩුපාඩුකම් මගහරවා මෙම පහසුකම් ඔවුන් වෙත ලබා දෙන මධ්‍යස්ථානයක් ලෙස වතුවලට කටයුතු කළහැක.

ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සැළසුම් කිරීමේදී වත්තෙහි මෙන්ම ගමේද මිනිස් සම්පත් සැළකිල්ලට ගෙන ඒවා සැළසුම් කිරීම. ගොවිතැන පදනම් කර ගත් කර්මාන්ත සැළසුම් කිරීමේදීද මෙම සම්පත්ද මනාව ලැබෙන අයුරින් ඒවා සැළසුම් කිරීම උදහරණයක් ලෙස දක්වා ඇත.

> **පෙර තිබූ අයුරින් වතුවලට ගැමියන් හා ගම්වලින් ඈත් වූ වෙනම ඒකක ලෙස පැවතීමට හා දියුණු වීමට ඉඩ නොදිය යුතුය. ගමත් වත්තත් එකමුතු කෙරෙන මූලික පදනම වැටෙනුයේ එවිටය.**

මංමාවත්, ජල පහසුකම්, විදුලි බලය වැනි සේවා සැළසුම් කිරීමේදී ගමත්-වත්තත් වෙන් කළ දෙබිඩි පිළිවෙත් ගැන නොසලකා එකම ඒකකයක් ලෙස සැළසුම් කළයුතුය.

**ආයතනික සහයෝගිතාවය- ග්‍රාම සංවර්ධන සමිති, සමුපකාර වැනි සමිති ගම්වලට පමණක් තම සේවය කැප කර ඇත. වතු සඳහා මෙම සේවය කිරීමට වෙනම සංවිධාන රජයට පවරාගත් වතුවලත් අළුතින් සංවිධානය කර ඇත. මෙය විවිධ අන්දමේ ආරවුල් එදිරිවාදිකම් තවදුරටත් ගෙනයාමක් වේ. මෙම තත්වය නැති කිරීමට නම් වත්තත් ගමත් මෙම ආයතනවල නියෝජිතයන් වන පරිදි මෙම ආයතන සකස් කළ යුතුය. එලෙසින්ම වතු පාලක මණ්ඩල වැනි ආයතනවලට ගැමි ආයතන සාමාජිකයින්ද පත් කළයුතු වේ.**

**සමාජ සහයෝගිතාවය**-ඇතැම් ප්‍රදේශවල වතු, ගම්මුන්ගෙන් ආර්ථික වශයෙන් මෙන්ම සංස්කෘතික වශයෙන්ද ඉතා ඈත්ව වෙනමම ඒකක ලෙස කටයුතු කර ඇත. මෙම තත්වය පොල් ඉඩම් ප්‍රදේශයේ එතරම්ම නොමැති වුවද පොදුවේ ගත් කළ මෙම තත්වය නැති කළහැක්කේ ශ්‍රමදන කටයුතු, ප්‍රජා මණ්ඩල, ක්‍රීඩා හා අධ්‍යාපනික පහසුකම් ගමටත්, වත්තටත් පොදුවේ ලැබෙන අයුරින් සකස් කළවිටය. පන්සල්වල පිංකම් වැනි සම්ප්‍රදයික සංස්කෘතික කටයුතු පැවැත්වීමේදීද දෙපැත්ත එකමුතුව කටයුතු කිරීම ඔවුනොවුන් අතර සුහද සහභාගිතාවයක් ඇති කිරීමේලා උපකාරී වනු ඇත.